# නව ප්‍රකාශන මිල දී ගැනීමේ ව්‍යාපෘතිය -2026

**ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය**

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

# නීති රීති හා කොන්දේසි

01. 2024, 2025 සහ 2026 වන වර්ෂවල මුද්‍රිත ග්‍රන්ථ පමණක් භාරගනු ලැබේ. එබැවින් ප්‍රකාශිත වර්ෂය නිශ්චිතව ග්‍රන්ථයේ සඳහන් විය යුතුය.

02. ග්‍රන්ථයක ප්‍රථම මුද්‍රණය පමණක් ඉදිරිපත් කළ හැකි අතර, අයදුම්පත ඉදිරිපත් කිරීමේදී මුද්‍රිත පොතෙහි පිටපතක් ද ඉදිරිපත් කළ යුතුය.

03. එක් ලේඛකයකුට ඉදිරිපත් කළ හැකි වන්නේ ග්‍රන්ථ දෙකක් පමණි

04. ස්වතන්ත්‍ර නිර්මාණයක් නම් අදාළ කර්තෘ/ කර්තෘන් විසින් ද, පරිවර්තනයක් නම් අදාළ පරිවර්තක විසින් ද, අයදුම්පත ඉදිරිපත් කළ යුතුය. සම කර්තෘ කෘතියක් ඉදිරිපත් කිරීමේ දී සම කර්තෘන් විසින් අයදුම්පත අත්සන් කළ යුතු අතර, මුදල් ගෙවීම හා මණ්ඩලය සමඟ කෙරෙන අනෙකුත් කටයුතු සඳහා එක් කර්තෘවරයකු නම් කළ යුතු වේ.

05. ග්‍රන්ථය අවම වශයෙන් මුද්‍රිත පිටු 49කින් සමන්විත විය යුතුය. ළමා කෘතියක් නම් එහි අවම මුද්‍රිත පිටු සංඛ්‍යාව 16ක් විය යුතුය. ග්‍රන්ථයේ සැකැස්ම ග්‍රන්ථ විද්‍යාත්මකව සිදු කර තිබිය යුතු අතර නියමිත ප්‍රමිතියෙන් තොර ග්‍රන්ථ භාරගනු නොලැබේ.

06. ISBN හෝ ISMN අංකය නිවැරදිව සඳහන් කර තිබිය යුතු වේ. (මෙම අංක රහිත හෝ සාවද්‍ය අංක සහිත හෝ අංකය නිවැරදිව සඳහන් නොවූ ප්‍රකාශන ප්‍රතික්ෂේප කෙරේ.)

07. පුනර් මුද්‍රණ, නිශ්චිත විෂය නිර්දේශ අරමුණු කොට රචිත ග්‍රන්ථ හා විභාග සඳහා විෂය උපකාරක මට්ටමින් සකස් වූ ග්‍රන්ථ මෙම ව්‍යාපෘතියට භාර නොගැනේ.

08. කිසියම් ආගමකට, දේශපාලන පක්ෂයකට හෝ පිළිගත් සමාජ කණ්ඩායමකට ඍජුව ම පහර එල්ල කෙරෙන කරුණු ඇතුළත් වන හෝ පිළිගත් සදාචාර සම්මුතිවලට එරෙහි කරුණු ඇතුළත් වන ග්‍රන්ථ භාරගනු නොලැබේ.

09. වෙළෙඳ දැන්වීම් සහිත ග්‍රන්ථ, විවිධ ලේඛකයන්ගේ ලිපි සංග්‍රහ, වාණිජ ප්‍රකාශන, සමරු කලාප, උපහාර කලාප, රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන මඟින් මුද්‍රණ අනුග්‍රහය හෝ ආධාර ලබා ප්‍රකාශිත ග්‍රන්ථ භාරගනු නොලැබේ.

10. වෙළඳ මිල ග්‍රන්ථයේ නිවැරදිව මුද්‍රණය කර තිබිය යුතු වේ.

11. ග්‍රන්ථ කර්තෘන්ට සහාය වීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන බැවින් මෙම ව්‍යාපෘතිය යටතේ පොත් මිල දී ගැනීමේ දී මණ්ඩලය ගනුදෙනු කරනු ලබනුයේ අදාළ ග්‍රන්ථයේ කර්තෘ සමඟ පමණි.

12. ග්‍රන්ථයේ කතුවරයාගේ වයස අවුරුදු 18ට අඩු නම් දෙමව්පියන් හෝ භාරකරුවකු ඉදිරිපත් විය යුතුය.

13. මිල දී ගැනීමට අනුමත පොත් සඳහා ගෙවීම් කිරීමේ දී 20%ක වට්ටමක් හා 2%ක සේවා ගාස්තුවක් අයකරනු ලැබේ.

14. මෙම ව්‍යාපෘතිය යටතේ යම් කෘතියක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ අවසාන තීරණය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සතු වේ.

15. අයදුම්පත් යොමු කිරීමේ දී මහජන බැංකුව, කොළඹ පුරහල ශාඛාවේ අංක 167-1-001-6-3170315 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ගිණුමට රු.100.00 ක මුදලක් බැර කර අදාළ අයදුම්පත සහ කෘතිය යොමු කළ යුතුය.

---

**ලිපි හා විමසීම්** ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07

**දුරකථන** - 011-2687583
**ඊමේල්** - isbnsrilanka@mail.natlib.lk
**වෙබ්** www.natlib.lk